# ක්‍රෙඩිට් කාඩ්පත් සන්සන්දනය

| | ප්‍රිමියර් මාස්ටර්කාඩ් | ඇඩ්වාන්ස් වීසා ප්ලැටිනම් | වීසා සිග්නේචර් | වීසා ප්ලැටිනම් | වීසා ගෝල්ඩ් |
|---|---|---|---|---|---|
| යෝග්‍යතා උපමානය | ඔබ දැනටමත් HSBC Premier ගනුදෙනුකරුවකු විය යුතුය | ඔබ දැනටමත් HSBC Advance ගනුදෙනුකරුවකු විය යුතුය | ශ්‍රීලංරු.200,000ක මාසික දළ ආදායමක් හෝ ස්ථිර තැන්පතුවක ශ්‍රීලංරු මිලියන 1ක් | ශ්‍රීලංරු.50,000ක මාසික දළ ආදායමක් | ශ්‍රීලංරු. 20,000ක මාසික දළ ආදායමක් |
| **විස්තරය** | | | | | |
| | HSBC Premier ගිණුම් හිමියන් සඳහා පමණක් සුවිශේෂී වේ. ඔබ වෙත වරප්‍රසාද සහ පාරිතෝෂික පිරිනමනු ලබන අතර, ලොව පුරා ස්ථාන මිලියන 24ක දී පිළිගනු ලබයි | HSBC Advance ගිණුම් හිමියන් සඳහා පමණක් සුවිශේෂි වේ. ඔබගේ සියලු අවශ්‍යතාවයන් සපුරාලන කාඩ්පත HSBC Visa Platinum ක්‍රෙඩිට් කාඩ්පතයි | තෝරාගත් කිහිපදෙනෙකු සඳහා නිර්මාණය කර ඇති HSBC හි නව Visa Sigíture ක්‍රෙඩිට් කාඩ්පතින් සමෘද්ධිය හා නිමක් නොමැති වරප්‍රසාද රැසක් ඔබ වෙත පිරිනැමේ | සාප්පු සවාරි, ආහාර-පාන සහ චාරිකා වරප්‍රසාද සියල්ල භුක්ති විඳින්න එපමණක් නොව, ඔබේ දිනපතා වැය කිරීම් සඳහා 10% cashback සමඟ අමතර ප්‍රතිලාභ ද පිරිනමයි | ජීවිතයේ අවශ්‍යතාවයන් හා සුවිශේෂී අවස්ථාවන් සඳහා වැයකර, ඒ සඳහා පාරිතෝෂික දිනාගැනීමේ කදිම මාර්ගයකි |

| විශේෂ ලක්ෂණ | | | | | |
|---|---|---|---|---|---|
| ලකුණු | වැය කරනු ලබන සෑම ශ්‍රීලංරු.100ක් සඳහා ම එක් ලකුණක් | වැය කරනු ලබන සෑම ශ්‍රීලංරු.100ක් සඳහා ම එක් ලකුණක් | වැය කරනු ලබන සෑම ශ්‍රීලංරු.100ක් සඳහා ම එක් ලකුණක් | | වැය කරනු ලබන සෑම ශ්‍රීලංරු.100ක් සඳහා ම එක් ලකුණක් |
| Home & Away වරප්‍රසාද | √ | √ | √ | √ | √ |
| විශේෂ සැලසුම් වරප්‍රසාද | √ | √ | √ | එදිනෙදා සිදුකරන වැයකිරීම් සඳහා 10% cashback දීමනාව | √ |
| සම්බන්ධවීමේ ගාස්තු | නොමිලේ | නොමිලේ | ශ්‍රීලංරු.2,500 | ශ්‍රීලංරු.1,500 | ශ්‍රීලංරු.750 |
| වාර්ෂික ගාස්තු | ජීවිත කාලය පුරාවට ම නොමිලේ | | ශ්‍රීලංරු.7,000 | ශ්‍රීලංරු.4,250 | ශ්‍රීලංරු.2,250 |
| **සේවාවන්** | | | | | |
| අන්තර්ජාල බැංකුකරණය | √ | √ | √ | √ | √ |
| දුරකථන බැංකුකරණය | √ | √ | √ | √ | √ |

**ප්‍රතිලාභ සහ විශේෂ ලක්ෂණ**

- හදිසි අවස්ථාවක දී ඔබේ ක්‍රෙඩිට් කාඩ්පත භාවිත කරන්න - උදා: රෝහල්
- දින 51ක් දක්වා පොලී රහිත ණය පහසුකම් භුක්ති විඳින්න
- ආපසු ගෙවීමේ නම්‍යශීලී පහසුකම්
- නොමිලේ චාරිකා රක්ෂණ
- අපගේ පුළුල් ATM ජාලය හරහා ඔබට මුදල් අත්තිකාරම් ලබාගත හැකිය
- පැය 24 පුරා ඇති පාරිභෝගික ක්ෂණික ඇමතුම් සේවාව
- අතිරේක කාඩ්පතක් පවුලේ සාමාජිකයන්ට හිමි වේ

**Platinum කාඩ්පතක් සඳහා අයදුම් කරන්නේ කෙසේ ද?**

| | |
|---|---|
| HSBC වෙත නවකයෙකු ද? Platinum කාඩ්පතක් සඳහා අයදුම් කිරීම පහසුය<br><br>දැන්ම අයදුම් කරන්න | දැනටමත් ගනුදෙනුකරුවකු නම්, ඉදිරියට යාම පිණිස, කරුණාකර 'දැන්ම අයදුම් කරන්න' මත click කරන්න<br><br>දැන්ම අයදුම් කරන්න |

**අතිරේක ක්‍රෙඩිට් කාඩ්පත**

ඔබේ ආදරණීයයන් සඳහා HSBC Visa නව අතිරේක ක්‍රෙඩිට් කාඩ්පතක් අයදුම්කර, ප්‍රතිලාභ රැසක් හා සුවිශේෂී දීමනාවන් භුක්ති විඳින්න

දැන්ම අයදුම් කරන්න

අවශ්‍යතාවන්

- අවම වශයෙන් ඔබට වයස අවුරුදු 18ක් විය යුතු ය
- අවම වශයෙන් මාසිකව ශ්‍රීලංරු.50,000 (දළ) ඔබ වෙත ගෙවනු ලබන ස්ථිර රැකියාවකට ඔබ හිමිකම් කිව යුතුය

**වැඩි විස්තර අවශ්‍ය ද?**

අපගේ ක්‍රෙඩිට් කාඩ්පත් පිළිබඳ වැඩි විස්තර ඔබට දැනගැනීමට අවශ්‍ය නම්, කරුණාකර 4 4722 42 (ගනුදෙනුකරුවන් සඳහා පැය 24 පුරා ඇති ක්ෂණික ඇමතුම් අංකය) හරහා අප අමතන්න නැතිනම්, ළඟම පිහිටි ඔබේ ශාඛාව වෙත පියනගන්න. ඔබට, විද්‍යුත් තැපැල් හරහා ද අප සමග සම්බන්ධ විය හැකිය

| **HSBC Visa Signature** |
|---|
| **ප්‍රතිලාභ සහ වරප්‍රසාද** |
| **සුවිශේෂී, නවතම HSBC Visa Signature කාඩ්පත**<br><br>**මෙතෙර සහ එතෙර දී එකම කාඩ්පතක්**<br><br>5X, අපගේ හවුල්කාර ගුවන් සමාගම් සමග ගුවන් සැතපුම් දැන්ම අයදුම් කරන්න<br><br>ව්‍යාපාරික පංතියේ ගුවන් ගමන් සඳහා ඇදහිය නොහැකි ඉතිරිකිරීම්<br><br>ප්‍රයොරිටි පාස් (Priority Pass); 600ක ට අධික ගුවන් තොටුපළ සංඛ්‍යාවක VIP Lounge වෙත පිවිසීමේ හැකියාව<br><br>ඔබේ කාඩ්පතින් වැය කළ මුදල මත පදනම් ව ඔබ හා එක් ව සංචාරය කරන අය වෙත නොමිළේ ගුවන් ටිකට්පතක්<br><br>ජාත්‍යන්තර තත්ත්වයේ සුඛෝපභෝගී බව අත්විඳින්න<br><br>ලෝකයේ සොඳුරු තැන් නරඹා ඇති ඔබගේ නිවාඩු ගතකිරීම් සැපදායක අත්දැකීම් බවට හැරවීමට අප කැමැත්තෙමු.<br><br>හඳුන්වාදෙනු ලබන HSBC Visa Signature කාඩ්පත මගින් ව්‍යාපාර පංතිය සඳහා විශ්මිත ඉතිරිකිරීම්, එතෙර දී සිතට සහනය සලසන චාරිකා රක්ෂණ, ඔබේ කාඩ්පතින් වැය කර ඇති ප්‍රමාණය මත, තමන් සමග විදෙස් සංචාරයට එක්වන අය සඳහා නොමිළේ ගුවන් ටිකට්පතක්, අපගේ ගුවන් ගමන් සහකරුවන් වෙතින් පාරිතෝෂික ගුවන් සැතපුම් පිරිනැමීම සහ ලොව පුරා 600ක ට අධික ගුවන් තොටුපළ සංඛ්‍යාවක දී VIP Lounge වෙත පිවිසීමේ හැකියාව ආදී ප්‍රතිලාභ රැසක් ඔබට පිරිනැමෙයි.<br>HSBC Visa Signature කාඩ්පත. මෙතෙර හා එතෙර සඳහා එක ම කාඩ්පතක් |
| **ඔබේ HSBC Visa Signature කාඩ්පත සමග වරප්‍රසාද සපිරි ලොවකට පිවිසෙන්න.**<br>මෙතෙර හා එතෙර දී වරප්‍රසාද රැසක් සමග අසමසම චාරිකා අත්දැකීමක් ඔබේ HSBC Visa Signature කාඩ්පත මගින් භුක්ති විඳින්න. |

**ඔබ හා එක් ව සංචාරය කරන අය වෙත නොමිළේ ගුවන් ටිකට්පතක්**

සුවිශේෂී අයෙකු සමග කරනු ලබන සංචාර වඩා ප්‍රීතිමත් බව විශ්වාස කරන ඔබටයි මේ අවස්ථාව. කලින් තීරණය කරනු ලැබූ මුදල් ප්‍රමාණයක් සඳහා වසරක් පුරා ඔබේ කාඩ්පත භාවිත කරන්න. ඔබ හා එක් ව සංචාරය කරන ඒ සුවිශේෂී අය වෙනුවෙන් අපගේ සුභපැතුම් සමග නොමිළේ ගුවන් ටිකට්පතක් පිරිනමමු.*

5X, අපගේ හවුල්කාර ගුවන් සමාගම් සමග ගුවන් සැතපුම්

අපගේ හවුල්කාර ගුවන් සමාගම් වෙතින් අන්තර්ජාලය හරහා ඔබ ගුවන් ටිකට්පත් වෙන්කරවා ගනු ලබන සෑම අවස්ථාවක දී ම 5X ගුවන් සැතපුම් ඔබ වෙත පිරිනමමු.*

| | | | |
|---|---|---|---|
| Asia Miles | QATAR | Kris Flyer | FLY Smiles |
| Cathay Pacific Airways | Qatar Airways | Singapore Airlines | Srilankan Airlines |

**ගුවන් තොටුපළවල දී Lounge වෙත පිවිසීමට ප්‍රයොරිටි පාස් (Priority Pass)**

මෙම පිරිනැමීම, නිදහස් සංචාරයන් හා විශිෂ්ට ගමනාන්තයන් සිය ජීවන රටාවේ තවත් කොටසක් වශයෙන් සලකනු ලබන ඔබටයි. ඔබ පියාසර කිරීමට තෝරාගන්නා ගුවන් සමාගම සහ පංතිය කුමක් වුවත්, සංචාරයේ දී ඔබ ගුවන් තොටුපළක සිටින කාලය තුළ ඔබේ සිත නිදහස් ව තැබීමට අප කැමතිය. ප්‍රයොරිටි පාස් සමග හවුල්කාරිත්වය දරන බැවින් ලෝකයේ විශාලතම ස්වාධීන Lounge වැඩසටහන හරහා සුළු ගාස්තුවක් මත සිත සනහන VIP Lounge වෙත පිවිස, ගුවන් තොටුපළවල සාමාන්‍යයෙන් ඇති කලබලකාරී බවින් මිදීමට ඔබට හැකි ය. කරුණාකර පහත දක්වා අදාළ ගාස්තු කියවා බලන්න. වැඩි විස්තර සඳහා www.prioritypass.com වෙත පිවිසෙන්න.

**ව්‍යාපාරික පංතියේ ගුවන් ගමන් සඳහා ඇඳහිය නොහැකි ඉතිරිකිරීම්**

සෑම සංචාරයක දී ම ඔබ නව අත්දැකීම් ලැබීමට අදහස් කරනු ඇත. ප්‍රමුඛ පෙළේ ගුවන් සමාගම් සමග HSBC Visa Signature ක්‍රෙඩිට් කාඩ්පත්, ව්‍යාපාර පංතිය සහ පළමු පෙළේ පංතිය සඳහා ඇඳහිය නොහැකි ඉතිරිකිරීම් පිරිනමනු ලබයි. ඔබ කැමති ඕනෑම ගමනාන්තයක් කරා ඔබට කැමති ඕනෑම අවස්ථාවක, ඔබට කැමති වාර ගණනක් සංචාරය කිරීමේ නිදහස ඒ හරහා ඔබට ලැබේ.*

**ජාත්‍යන්තර තත්ත්වයේ සුඛෝපභෝගී බව අත්විඳින්න**

නිතර සංචාරය කරන අයෙකු නම්, බොහෝ විට ඔබ සිටිනුයේ නිවසින් ඈත් ව විය හැකියි. HSBC Visa Signature ක්‍රෙඩිට් කාඩ්පත මගින් ලොව පුරා සුඛෝපභෝගී හෝටල් 800කට වැඩි සංඛ්‍යාවක් සඳහා ඉතා ම හොඳම මිළ ගණන් ලබාගැනීමේ හැකියාව ඔබට ලැබේ. ලෝකයේ සුන්දර ගොල්ෆ් පිටි සඳහා වන ගාස්තු මත 50% දක්වා ඉහළ ඉතිරිකිරීම් ද ලැබීමේ හැකියාව ඔබට ඇත. www.signature-asia වෙත පිවිසෙන්න.

**සිත සහනය**

මෙම පිරිනැමීම, සුරක්ෂිත භාවයෙන් යුතු ව සංචාරයට කැමති ඔබ වෙතයි. සංචාරය කිරීමත් එක් අයුරකින් සිතට කිසියම් බරකි. විදේශ ගමනාන්තයක දී අනපේක්ෂිත සිදුවීමකට මුහුණ පාන්නට සිදු වුවහොත් එය ද සිත සහනයට බලපානු ඇත. HSBC Visa Signature ක්‍රෙඩිට් කාඩ්පත් හිමියකු වශයෙන් ඔබට ඇ.ඩො.500,000ක චාරිකා රක්ෂණාවරණයක් සහ සේෆ්කාඩ් (Safe Card) රක්ෂණාවරණයක් නොමිළේ හිමි වෙයි. එය ඔබේ සිතට බලවත් සහනයක් වන බව අප දනිමු.

**CCW/QCG/CCC/2018.6/SIN**